# හැඟීම්වලට වහල්වීම

ගුත්තිල කාව්‍යය ඊනියා යථාර්ථවාදී කෘතියක් නොවන බව තත් නැති වීණාව, සක් දෙවිඳුගේ පැමිණීම ආදියෙන් පැහැදිලි වෙයි. ඊනියා යථාර්ථවාදී සාහිත්‍ය කෘති යන්න සිංහල බෞද්ධ සාහිත්‍යයෙහි හෝ සිංහල බෞද්ධ සාහිත්‍ය විචාරයක හෝ යොදාගත යුතු සංකල්පයක්වත් නො වෙයි. එයට හේතුව යථාර්ථවාදය යන්න සිංහල බෞද්ධ සංස්කෘතියක තිබිය යුතු සංකල්පයක් නොවීම ය. සිංහල බෞද්ධයනට ඊනියා යථාර්ථයක් නැත. සිංහල බෞද්ධයනට ඇත්තේ සම්මුතියක් පමණකි. අපි සක් දෙවිඳුගේ පැවැත්ම පිළිබඳ සම්මුතීන් හතරක් සාකච්ඡා කෙළෙමු.

සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඊනියා යථාර්ථයක් නැතිවත් මාර්ටින් වික්‍රමසිංහ මහතා ඔහුට අනුව සිංහල සාහිත්‍ය විචාරයක් හඳුන්වාදෙමින් ගුත්තිල කාව්‍යය යථාර්ථවාදී සාහිත්‍යයෙහි මුදුන් මල්කඩ යැයි ප්‍රකාශ කෙළේ ය. එහෙත් මෙය මුසාවක් බවත් ගුත්තිලයෙහි ඊනියා යථාර්ථයක් නැති බවත් අපි දනිමු. අප කලින් සඳහන්කර ඇති ආකාරයට මාර්ටින් වික්‍රමසිංහ මහතා එවැනි දුර්මත ප්‍රකාශ කෙළේ සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් අදීන බව පෙන්වීමට  ඒ මහතාට තිබූ වුවමනාවත් සිංහල සංස්කෘතිය බටහිර සංස්කෘතියට ඇතැම් කරුණු අතින් සමාන යැයි පෙන්වීමට තිබූ වුවමනාවත් හේතුකොටගෙන ය.

අපි මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ පළමු ප්‍රයත්නය, එනම් සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් අදීන බව පෙන්වීම, අගය කරමු. එහෙත් ඒ මහතා සිංහල සංස්කෘතිය ඇතැම් කරුණුවලින් බටහිර සංස්කෘතියට සමාන බව පෙන්වීමට තැත්කිරීම ප්‍රතික්ෂේප කරමු. ඒ මහතා සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් අදීන බව පෙන්වීමට උත්සාහ ගත්තේ ද එමගින් සිංහල සංස්කෘතිය බටහිර සංස්කෘතිය සමග සංසන්දනය කිරීමට විය හැකි ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා සිංහල විචාර කලාවක් හඳුන්වාදුන් බව කියන නමුත් ඒ මහතා කෙළේ බටහිර යථාර්ථවාදී සාහිත්‍ය විචාරය සිංහල පාඨකයන් අතර තහවුරුකිරීමට උත්සාහ ගැනීම ය. ඒ මහතා සාහිත්‍ය කෘති නිර්මාණය කෙළේ ද බටහිර ,ඊනියා යථාර්ථවාදී සාහිත්‍ය කෘති අනුකරණය කරමින් ය. පසුව ඒ මහතා පේරාදෙණි විශ්වවිද්‍යාලයෙන් (උපාධි නොවුවත්) සහතික ලැබුවේ සරච්චන්ද්‍ර මහතා බටහිර සාහිත්‍ය කෘති විචාරයක් පදනම් කරගනිමින් වික්‍රමසිංහ මහතාගේ කෘති විවේචනයකිරීමට පටන්ගැනීමෙන් පසුව ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා සිංහලෙන් බටහිර නවකතා හා කෙටිකතා ලීවේ යැයි කීම නිවැරදි ය.

සිංහල සාහිත්‍යය අවුරුදු පන්සියයකට පෙර බිහි වූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයක් වූ බටහිර නවකතා හා කෙටිකතා පසුපස යා යුතු නො වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පෞද්ගලිකත්වය වර්ධනය කරයි. බටහිර සාහිත්‍යයෙහි ඊනියා චරිත නිරූපණයට වැදගත් තැනක් ලැබෙන්නේ ද මේ පෞද්ගලිකත්වය මුල් කරගෙන ය. බටහිර සාහිත්‍යයෙහි චරිත හැසිරෙන්නේ සමාජ පසුබදමක බව සැබෑ ය. එහෙත් එහි වැදගත් හා ප්‍රධාන තැන ලැබෙන්නේ චරිත විකාශයට මිස සමාජ පසුබිමට නො වෙයි. සමාජ පසුබිම සැලකිල්ලට ගන්නා අවස්ථාවල ද සමස්තයක් ලෙස ගත් සමාජය පෞද්ගලිකත්වයට යටවෙයි.

මෙහි දී බටහිර සාහිත්‍යය විසින් ගෙනහැර දක්වන්නේ කිනම් සාරධර්ම (values) ද යන්න සලකා බැලිය යුතු වෙයි. පහළොස්වැනි සියවසෙහි බිහිවූ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සාරධර්ම බටහිර සාහිත්‍යයෙහි අඩංගු වෙයි. එහෙත් බටහිර සාහිත්‍යය ඒ සාරධර්ම සෘජුව ම නොකීමට වග බලාගනියි. බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඒ ඒ කරුණු අනෙක් කරුණුවලින් වෙන්කර ඉදිරිපත් කෙරෙයි. එබැවින් සාහිත්‍යය සාරධර්මවලින් වෙන්කෙරී ඇති බව පෙන්වීමට බටහිරයන්ට සිදුවෙයි. බටහිරයන් රාජ්‍යය ආගමින් හා සංස්කෘතියෙන් වෙන් කරන්නේ ද එපරිද්දෙනි.

බටහිරයන් එසේ ඒ ඒ දෑ අනෙක් දැයින් වෙන්කර පෙන්වීමට උත්සාහ ගත්තද ඒ සියල්ල එකිනෙකට බැඳී ඇත. එබැවින් බටහිර නවකතාවල, කෙටිකතාවල හා වෙනත් සාහිත්‍යාංගවල, අවිඥානිකව ම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සාරධර්ම කියැවෙයි. එවිට ඒ කෘති කියවන පාඨකයාට ඒ සාරධර්ම අවිඥානිකව ම ලැබෙයි. කුඩා

© Prof. Nalin De Silva

දරුවන් බොහෝ දෑ ඉගෙන ගන්නේ තම දෙමව්පියන් ඇතුළු වැඩිමහළු අයගෙන් අවිඥානිකව ය. දරුවෝ ඒ කිසිවක් සවිඥානිකව නුගනිති.

දරුවන්ට සවිඥානිකව ඒ උගන්නන් නැති වුව ද, දරුවෝ අවිඥානික ව ඒ දෑ තම වැඩිහිටියන්ගේ හැසිරීම් ඔස්සේ ලබාගනිති. දරුවන් වැඩිහිටියන්ගේ ඇතැම් හැසිරීම් අනුකරණය කරන්නේ ඒ හැසිරීම් සවිඥානිකව අධ්‍යයනය කිරීමෙන් පසුව නො වෙයි. දරුවෝ නිරායාසයෙන් ම ඒ ලබා ගනිති. මෙහි දී අවධාරණය කළ යුතු කරුණක් නම් දරුවන් ඒ ඒ දෑ වැඩිහිටියන්ගෙන් ලබාගැනීම ගැන දරුවන්වත් නොදන්නා බව ය. ඔවුන්ට එසේ දැනුම ලබාගන්නා බවවත් එතේ දැනුම ලබාගැනීමට හැකිබවවත් ඔවුහු නො දනිති.

කෙටිකතා හා නවකතා පාඨකයන් පමණක් නොව නාට්‍ය, සිනමා ආදිය නරඹන ප්‍රේක්ෂකයන් ද ඒ ඒ කලාකෘති ඔස්සේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සාරධර්ම ලබාගනිති. අද මෙරට වැටී සිටින ඛේදනීය තත්වයට බටහිර සාහිත්‍ය අනුකරණය ද යම් ප්‍රමාණයකට හෝ වගකිව යුතු ය. හැඟීම්වලට වහල්වීම වරදක් ලෙස නුතන්වන කලාකෘතියක් පරිශීලනය කිරීමෙන් යමකු තුළ ඒ අනුගමනය කිරීමට යම් සිතක් පහළ වුවහොත් ඒ පුදුමයට කරුණක් නො වෙයි.

අද තැන තැන ප්‍රදර්ශනය කෙරෙන එක්තරා දැන්වීම් පුවරුවක් මගින් ජනතාවගෙන් හැඟීම්වලට වහල්වන ලෙස ඉල්ලා සිටිනු දක්නට හැකි ය. එක්තරා ගුවන්විදුලි නාලිකාවක් මේ ඉල්ලීම කරන්නේ තම නාලිකාවෙන් ශ්‍රාවකයන්ගේ හැඟීම් ඉලිප්පීමට කරන වැඩසටහන්වලට ජනතාව ඇද ගැනීමට ය. මේ නාලිකා අයිතිකරුවන් අවසානයේ දී කරන්නේ බටහිර ක්‍රිස්තියානි නුතනත්වයේ පෞද්ගලිකත්වය, ඉන්ද්‍රිය පිනවීම, හැඟීම් පසුපස යෑම ආදිය වර්ධනය කිරීම ය.

යමකු මේ සමාජ විරෝධී කටයුත්ත හමුවේ හැඟීම්වලට වහල් වී ඒ දැන්වීම් පුවරු කඩා දැමුවහොත් සිදුවන්නේ කුමක් ද? ඒ පුද්ගලයා අධිකරණයට ඉදිරිපත්කර ඒ අයට දඬුවම් කෙරෙනු ඇත. ඒ දැන්වීම් පුවරුවක් කඩා දැම්මේ වරදට ය. එහි දී හැඟීම්වලට වහල්වීම දඬුවම් ලැබිය යුතු වරදක් වෙයි. එහෙත් හැඟීම්වලට වහල්වීමට මිනිසුන් පෙළඹවීම වරදක් නො වෙයි.

බටහිර ක්‍රිස්තියානි නුතනත්වයේ නීතිය ක්‍රියාත්මකවන ආකාරය මෙහි දී දැකගත හැකි ය. බටහිර කිදස්තියානි නුතනත්වය බිහිවුයේ ද, පවතින්නේ ද පෞද්ගලිකත්වය, ඉන්ද්‍රිය පිනවීම, හැඟීම්වලට වහල්වීම ආදිය වර්ධනය කිරීම පදනම් කර ගනිමිනි. බටහිර යුරෝපයේ මධ්‍යකාලීන කතෝලික චින්තනය විසින් මේ දෑ මැඩපවත්වනු ලැබිණි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ එක් අංගයකින් සිදු වුයේ ඒ මර්දනයට විරුද්ධ වීම ය.

බටහිර නීතිය බිහි වී ඇත්තේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. ඒ නීතියේ ප්‍රධාන කාර්යය වනුයේ අදාළ චින්තනය හා සංස්කෘතිය රැකගැනීම ය. එවැනි නීතියක් ගුවන්විදුලි නාලිකාව අයිතිකරුවන් ජනතාවගේ හැඟීම්වලට වහල්වීම වර්ධනය කිරීමට පක්ෂපාති වෙයි. ඒ අයිතිකරුවන්ට එවැනි දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම නෛතිකව උරුම වෙයි. එහෙත් හැඟීම්වලට වහල් වී දැන්වීම් පුවරුව කඩා දැමීම ගුවන්විදුලි නාලිකාවේ අයිතියක් පැහැර ගැනීමට තැත්කිරීමක් වෙයි.

හැඟීම්වලට වහල් වීම බටහිර ක්‍රිස්තියානි නුතනත්වයේ නීතියට පටහැනි නොවන්නේ දැයි කෙනකුට ප්‍රශ්න කළ හැකි ය. දැන්වීම් පුවරු කඩා දැමීම නීතිය ඉදිරියේ වරදක් ය යන්නෙන් ද ඒ තහවුරු වන බව කිව හැකි ය. බටහිර ක්‍රිස්තියානි නුතනත්ව නීතිය එසේ පුද්ගලයකුගේ හැඟීම්වලට වහල්වීමට විරුද්ධ වන්නේ ඒ පුද්ගලයාගේ ක්‍රියාව වෙනත් පුද්ගලයකුගේ පෞද්ගලිකත්වයට හෝ පෞද්ගලිකත්වය වර්ධනය කිරීමට හෝ එරෙහිව යන්නේ නම් ය. හැඟීම්වලට වහල් වී මට යමකුට පහර දීමට නො හැකි ය. ඒ එසේ පහර දීම පහර කන පුද්ගලයාගේ පෞද්ගලිකත්වයට එරෙහි වන බැවිනි.

කලින් සඳහන් කළ ගුවන්විදුලි නාලිකාව මෙන් ම අනෙක් බොහෝ ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා ද මුද්‍රිත මාධ්‍යය ද කෙටිකතා නාට්‍ය ආදිය මගින් කරන්නේ කිසිම විවේචනයකින් තොරව පුද්ගලයන්ගේ හැඟීම් වර්ධනය කිරීම බව

© Prof. Nalin De Silva

පැහැදිලි ය. එක්තරා ගුවන්විදුලි නාලිකාවක් දිනපතා මෙන් අනියම් සම්බන්ධකම්වලට පොහොර දමන කතාවක් නාට්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කරන්නේ ඒ ලංකාවේ කොහේ හෝ ප්‍රදේශයක කිසියම් දිනක සිදු වූ සිද්ධියක් ය යන්න ද පවසමිනි.

අසන්නන්ට සිතෙන්නේ මේ ඇත්ත සිද්ධියක් කියා ය. දිනපතා මෙන් ඇසෙන මේ නාටක හේතුවෙන් අනියම් සම්බන්ධකම් සාමාන්‍ය සිද්ධීන් බවට පත්කිරීමට උත්සාහයක් කෙරෙයි. එවැනි ක්‍රියාවන්ට එරෙහිව දඬුවමක් මෙලොව හෝ පරලොව හෝ පැනවෙන බවක් නාටකයෙන් නො කියැවෙයි. මෙවැනි නාටක ප්‍රචාරය කිරීම සමාජ විරෝධී වුවත් එයට විරුද්ධව නීතියෙන් ගතහැකි පියවරක් නැත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නීතිය ඇත්තේ ක්‍රමය රැකීමට මිස ක්‍රමයට විරුද්ධව කටයුතු කිරීමට නො වෙයි.

අද ඉතාමත් වර්ධනීය තත්වයකට පත් වී ඇති මේ හැඟීම්වලට වහල්වීමට අනුබල දීම සම්භාව්‍ය යැයි කියැවෙන බටහිර සාහිත්‍යයෙන් ද සිදුවෙයි. බටහිර ලෝරන්ස් නම් ලේකකයාගේ කෘති මේ සම්බන්ධයෙන් කාටත් පෙනෙන උදාහරණය වෙයි. ඒ කෘති බටහිර පවා ආන්දෝලනයක් ඇති කිරීමට සමත් විය. එයට හේතුව බටහිරයන් ඒ වන විට ද මුළුමනින් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පැමිණ නො තිබීම ය.  බටහිරයන් කතෝලික චින්තනයෙන් ග්‍රීක යුදෙව් චින්තනයට හැරීම එකා දවසකින් සිදු වූවක් නො වෙයි. ඒ තවමත් කෙරී ගෙන යයි. ලෝරන්ස් නම් ලේඛකයා කෙළේ මේ ක්‍රියාදාමයට යම් තල්ලුවක් දීම ය. රැජිනියා වික්ටෝරියානු සදාචාරයට විරුද්ධව යෑම යනුවෙන් හැඳින්වෙන්නේ මේ චින්තන පෙරළියේ එක් අවස්ථාවක් පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva